# ෆෙංෂුයි කලාව පිළිබඳ බෞද්ධ විචාරයක්

අත්තරගොඩ පියධම්ම හිමි[1]
අම්පේ විමලධම්ම හිමි[2]

## හැඳින්වීම

ෆෙංෂුයි යනු කුමක්දැයි නිර්වචනය කිරීම අවශ්‍ය නොවන තරම්ය. එය එතරම්ම ලාංකික ජන සමාජය ආක්‍රමණය කොට ඇති සෙයකි. කෙටියෙන්ම හඳුන්වන්නේ නම් චීන වාස්තු විද්‍යා ශිල්පය ෆෙංෂුයි යන්නෙන් විස්තර වේ. ෆෙංෂුයි යන්නෙහි වචනාර්ථය වනුයේ සුළඟ සහ ජලය යන්නයි. ලෞකික දියුණුව සහ සමෘද්ධිය උදෙසා ස්වාභාවික වස්තුවල පිහිට අයැදීම මෙහි ලක්ෂණයයි. මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් බලාපොරොත්තු වන්නේ වර්තමාන ශ්‍රී ලාංකේය සමාජයේ ව්‍යාප්ත වී ඇති ෆෙංෂුයි ශිල්ප ක්‍රම පිළිබඳව බෞද්ධ මූලධර්ම තුළින් විමසා බැලීමයි.

## අධ්‍යයනයේ අරමුණු

- ෆෙංෂුයි කලාව ලාංකේය සමාජයේ ව්‍යාප්ත වී ඇති ආකාරය හා ඒවා බෞද්ධ ඉගැන්වීම් තුළින් ප්‍රතික්ෂේප වන ආකාරය විමසා බැලීම.
- බෞද්ධ ඉගැන්වීම් තුළින් ආර්ථික සමෘද්ධිය ඇතිකර ගන්නා ආකාරය අධ්‍යයනය කිරීම.
- ලාංකේය ජනසමාජය විවිධ මිථ්‍යා විශ්වාසවලින් ගලවා ගැනීම.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතියික මූලාශ්‍ර අධ්‍යයනය මගින් දත්ත රැස්කිරීම සිදුකරන අතර ගුණාත්මක විශ්ලේෂණය යොදාගනිමින් දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව සිදුකරනු ලැබේ.

## දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව

පැරණි චීන ජන සමාජය එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ගැටලු සමනය කරගැනීම හා සම්පත උදාකරගැනීම උදෙසා සුදු අභිචාර විධියක් වශයෙන් ෆෙංෂුයි ක්‍රමය භාවිත කරන ලදී. සමාජ විද්‍යාව හෝ ඉතිහාසය මැනවින් අධ්‍යයනය කරන්නෙකුට චීනයේ පමණක් නොව ලොව සියලු පැරණි සමාජවල මෙවැනි අභිචාර විධි ක්‍රියාත්මක වූ බවට තොරතුරු සොයාගත හැකිය. පැරණි

---

[1] සහකාර කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අනුරාධපුර. dhammap@rocketmail.com
[2] සහකාර කථිකාචාර්ය ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අනුරාධපුර. ampedhamma@gmail.com

ලාංකීය ජනසමාජය තුළ ද නොයෙක් කෙම් ක්‍රම. ශාන්ති කර්ම ආදී අභිචාර විධි පැවතුණු අතර අද ද ඒවායේ ශේෂයන් දැකගත හැකිය.

ෆෙංෂුයි කලාව තුළ විද්‍යමාන වන ප්‍රධාන අරමුණු කිහිපයකි.

- ලෞකික දියුණුව ඇතිකරගැනීම
- ලෙඩ රෝග නිවාරණය කරගැනීම
- සතුට සහ සාමය ළඟාකරගැනීම

මෙහිලා බලන කල ලෞකික දියුණුව ඇතිකරගැනීම උදෙසා අනුගමනය කළ යුතු ෆෙංෂුයි ක්‍රම රාශියකි. උදාහරණ ලෙස රුවල් නැව, ලාෆින් ගෝඩ් (Laughing God), කකුල් තුනේ ගෙම්බා වැනි ෆෙංෂුයි උපකරණ හඳුන්වාදිය හැකිය. මෙවැනි උපකරණ නිවෙස් තුළ හෝ ව්‍යාපාරික ආයතන තුළ තැබීමෙන් ධන සම්පත උදාවන බවට විශ්වාස කෙරේ. ඉහත සඳහන් කළ උපකරණවලට අමතරව ලෞකික දියුණුව සලසා ගැනීම උදෙසා භාවිත කළ හැකි ෆෙංෂුයි උපකරණ දහසකුත් එකක් ෆෙංෂුයි භාණ්ඩ විකුණන ආයතන තුළින් මිළදී ගත හැකිය.

කෙසේවෙතත් මෙහි කිසිදු විද්‍යාත්මක සත්‍යතාවක් නොමැත. කෙසේ හෝ දියුණුවීම අරමුණු කරගත් සමාජයකට මෙවැනි දේ පහසුවෙන් අවශෝෂණය වන බව නම් පැහැදිලිය. ෆෙංෂුයි වෙළෙන්දන් පවසන ආකාරයට ඒ එක් එක් උපකරණවලින් ලැබෙන ශක්තිය හා බලය ප්‍රමාණ කළ නොහැකි තරම්ය. එසේ නම් ඒ සියලු උපකරණ එක් තැනක තබා වෙළදාම් කරන වෙළෙන්දන් හා වෙළඳ ආයතන කොපමණ ප්‍රමාණයකින් දියුණු විය යුතුද යන්න උපකල්පනය කළ නොහැකි තරම්ය. අනික් අතට ලංකාවේ හෝ ලෝකයේ ඉහළම පැලැන්තියේ කෝටිපතියන් හා ව්‍යාපාරිකයන් කොපමණ ප්‍රමාණයක් ෆෙංෂුයිවලින් පිහිට ලබා ඇතිද යන්න ගැටලුවකි.

ලෙඩ රෝග නිවාරණය උදෙසා ෆෙංෂුයි උපකරණවලින් විශාල බලපෑමක් ලැබෙන බව තවත් එක් විශ්වාසයකි. එහෙත් ෆෙංෂුයි වෙළෙන්දන්ට අනුව ලෙඩ රෝග සම්පූර්ණයෙන්ම නැතිකර ගැනීමේ හැකියාවක් ෆෙංෂුයිවලට නැත. ඇත්තේ රෝග අවම කිරීමේ හැකියාවකි. එහෙත් ෆෙංෂුයි මගින් ලෙඩ රෝග අවම කිරීමේ ප්‍රමාණය මැනගැනීමට ක්‍රමවේදයක් නොමැති වීම ද ගැටලුවකි.

ෆෙංෂුයි කලාවේ තවත් එක් අරමුණක් වන්නේ සතුට හා සාමය ඇතිකිරීමයි. ෆෙංෂුයි මගින් සතුට හෝ සාමය ඇතිකරන බවට කිසිදු විද්‍යාත්මක සාධකයක් නොමැත. ෆෙංෂුයි භාවිත කරන්නන් හා නොකරන්නන් අත්විඳින සතුටේ ප්‍රමාණය කෙසේ අඩු වැඩි වනවාදැයි යන්න පරීක්ෂා කළ යුතුව ඇත.

මේ අනුව බලන කල ෆෙංෂුයි කලාවේ කිසිදු විද්‍යාත්මක පදනමක් ගැබ්ව නොමැති බව ඕනෑම කෙනෙකුට පැහැදිලි වේ. මීළඟට අප විමසා බැලිය යුත්තේ ලාංකික ජනතාව ෆෙංෂුයි සඳහා පෙළඹී ඇති හේතූන්ය.

වර්තමාන ලෝක ආර්ථික රටාව තුළ ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ආර්ථික දුෂ්කරතා සහ මානසික පීඩනයයි. එවන් තත්වයක් තුළ කෙසේ හෝ ආර්ථිකය ශක්තිමත් කරගැනීමත්

මානසික පීඩනය සමනය කරගැනීමත් එවන් රටවල ජනතාවගේ ප්‍රධාන අභිප්‍රායයන් වී තිබේ. එසේ ස්වසමෘද්ධිය උදෙසා විවිධ අත්හදා බැලීම් කිරීම ඔවුන්ගේ පොදු ලක්‍ෂණයකි. වාසනාව හෝ අදෘශ්‍යමාන බලවේග පිළිබඳ විශ්වාසය ඇතිකර ගන්නා වූ සමහරු එමගින් සිය සමෘද්ධිය ඇතිකර ගැනීමට උත්සාහ දරන අතර එය ප්‍රයෝජනයට ගනිමින් මඩිය තරකරගන්නා පිරිසක් විවිධ නම්වලින් කලින් කලට බිහිවීම දැකගත හැකිය.

ධනාත්මක චින්තන, ෆෙංෂුයි හෝ දියුණුවේ රහස් ආදී වශයෙන් කලින් කල කරළියට එන්නේ එවන් මාෆියාවක කූටප්‍රාප්තීන්ය. මෙවැනි මාෆියාවන් හරහා එක් අතකින් පුද්ගල චින්තනය පරාධීන වන අතර අනෙක් අතින් තත් සමාජයේ හර පද්ධතීන් බරපතළ ලෙස අභියෝගයට ලක් වේ. ලාංකික සමාජයට අදාළව විමසා බැලුවහොත් මෙවැනි මාෆියාවන් හරහා ලාංකීය සංස්කෘතික හරපද්ධතීන් විනාශ මුඛයට යෑම නොවැළැක්විය හැකිව තිබේ.

බුදුදහම පදනම් කරගත් ලාංකීය ජන සමාජය මේ වන විට කූට වෙළෙන්දන්ගේ කෙළිබිමක් බවට පත්ව තිබීම ඉතා ඛේදජනකය. මෙලොව හා පරලොව සුභසිද්ධිය ඇතිකරගත යුතු ආකාරය පිළිබඳව විද්‍යාත්මක හා ප්‍රායෝගික කරුණු ඕනෑතරම් බුදුදහම තුළ පෙන්වා දී තිබියදීත් අන්ධ විශ්වාස හරහා සිය ස්වාධීන චින්තනය හා දර්ශනය යම් යම් බලවේග මත යැපෙන තත්වයට පත්කර ගැනීමට බෞද්ධයන් පෙළඹී තිබීම ඉතාම අවාසනාවන්ත තත්වයකි. අංගුත්තර නිකායේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වන පරිදි,

"වහන්ස, ගෘහස්ථ කාමභෝගී වන අප පුත්‍රදාරයන් විසින් සම්බාධ ඇති සයනයෙහි වසන්නෙමු. කසී සළු හා සඳුන් වළඳ කරම්හ. මල්ගඳ විලෙවුන් දරම්හ. රන් හා රිදී හා ඉවසම්හ.ඒ අපට යම් දහම් කෙනෙක් අපගේ ඉහාත්මයෙහි හිත පිණිස, ඉහාත්මයෙහි සැප පිණිස, පරලොවෙහි සැප පිණිස වන්නාහු නම් එලෙසින් දහම් දෙසන සේක්වා".

"ව්‍යාඝ්‍රපද්‍යය, මේ සතර දහම් කෙනෙක් කුලපුත්හුගේ ඉහාත්මයෙහි හිත පිණිස, ඉහාත්මයෙහි සැප පිණිස පවත්නාහ. කවර සතර දෙනෙක් ද යත්, උත්ථාන සම්පත් ය, ආරක්‍ෂා සම්පත් ය, කළ්‍යාණමිත්‍රතාව ය, සමජීවිකතාව යනුයි.

මෙහි දක්වන ලද මෙලොව දියුණුවට හේතුවන කරුණු හතර පමණක් ගත්තද එහි ඇති විශ්වීය සත්‍යතාව හා ප්‍රායෝගිකත්වය අවබෝධ කරගත හැකිය. මෙලොව වශයෙන් දියුණු වූ පුද්ගලයන් ලොව කොතැනක ජීවත් වුවද ඔවුන්ගේ දියුණුව උදෙසා දැන හෝ නොදැන ඉහත කරුණු හතර බලපා ඇති බව ඕනෑම අයෙකුට පරීක්‍ෂාකර බැලිය හැකිය. ඒවාට අමතරවද මෙලොව දියුණුව උදෙසා අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් බුදුදහම විවිධ සූත්‍ර ධර්ම හරහා අගනා ශිල්ප ක්‍රම හඳුන්වා දී තිබියදීත් ඒවා ඉවතලා නැවත පැරණි කෙම් ක්‍රම හා විවිධ අන්ධ විශ්වාස පසුපස යෑම, අත ඇති පහන නිවා දමා කළුවරේ අතපත ගෑමක් වැනි යැයි කිව හැකිය. බටහිර ලෝකය තුළ බුදුදහම පිළිබඳ අවධානය වැඩිවන්නට පටන්ගෙන ඇති යුගයක එහි පාරම්පරික උරුමකරුවන් එය නොසලකා හැරීම ඉතා ශෝචනීය තත්වයකි.

දෙවියන් විසින් ලෝකය මවන ලද්දේය, දෙවියන්ගේ කැමැත්තට අනුව මිනිසුන්ගේ ජීවිතය තීරණය වන්නේය, එනිසා දෙවියන්ට යාඥා කොට සුභසිද්ධිය සලසාගත යුතු වන්නේය යනාදී විශ්වාසයේත් ස්වාභාවික වස්තු හෝ යම් යම් උපකරණ මිනිසාගේ සුභසිද්ධිය සලසන්නේය යන විශ්වාසයේත් කිසිදු වෙනස්කමක් නොමැත.

"අත්තාහි අත්තනෝ නාථෝ
කෝ හි නාථෝ පරෝසියා"

යන බුදුවදනට අනුව තමන්ට පිහිට තමාමය. වෙන කිසිවක් නොවේ. එබැවින් තමන්ගේ මෙලොව හෝ පරලොව සුභසිද්ධිය සලසා ගත යුත්තේ තම උත්සාහයෙන් හා ඥානයෙනි. තම දියුණුව හෝ සමෘද්ධිය සලසාදීම වෙනත් බලවේගයකට හෝ උපකරණයකට පවරාදීම, සමාජයේ ගමන් මග හා චින්තනය ආපසු හැරවීමක් වන අතර එය මිනිසාගේ බුද්ධියට හා ස්වාධීනත්වයට කරන නිග්‍රහයක් බවද සැලකිය යුතුය.

**නිගමනය**

පැරණි සමාජ ක්‍රම තුළ පැවති විවිධ අභිචාර විධි නූතන දියුණු විද්‍යාත්මක සමාජ තුළ අභියෝගයට ලක්වී ඇති බව නොකිවමනාය. එවන් තත්වයක් තුළ තවදුරටත් එවැනි කෙම් ක්‍රම හෝ ශාන්තිකර්ම සඳහා වලංගුභාවයක් නොලැබෙන අතර නැවත එවැනි අභිචාරයන් සමාජගත වීම තුළ පෙනෙන්නට ඇත්තේ මුළු මහත් සමාජ ක්‍රමයම ආපස්සට හැරවීමකි. උත්සාහය, කැපවීම හා බුද්ධිය තුළින් දියුණුව කරා පුද්ගලයා යොමුවන බව බුදුදහම පෙන්වා දේ. එබැවින් බුදුදහම තුළින් ෆෙංෂුයි කලාව දැඩි සේ විවේචනයට ලක්වන බව පෙනේ. මෙනයින් බලන කල අවසානයේ දී ෆෙංෂුයි කලාව පිළිබඳ කිවහැක්කේ එය පාරිභෝගිකයන්ට කෙසේවෙතත් වෙළෙන්දන්ට නම් ධන වාසනාව හා සෞභාග්‍යය කැන්දන එකක් වනු ඇති බවය.

**ප්‍රමුඛ පද** : ලාංකික සමාජය, ෆෙංෂුයි, ආර්ථික දියුණුව, බෞද්ධ ආර්ථික දර්ශනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ඛුද්දක නිකාය* 2, ධම්මපද පාළි, බුද්ධ ජයන්ති මුද්‍රණය

වනිගරත්න, ආසිරි. *ෆෙංෂුයි සංකේත 1.* දෙහිවල: ෆෙංෂුයි කලෙක්ෂන්.

*අංගුත්තර නිකාය* 5, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, බුද්ධ ජයන්ති මුද්‍රණය